සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## බෞද්ධ ශිෂ්ටාචාරය - I

**12 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

- **අංක 01 සිට 50 දක්වා වූ ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4), (5) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

01. මහා බ්‍රහ්මයා විසින් මිනිසුන්ගේ ගුණ කර්ම භේදය සලකාගෙන සමාජයේ සිටින සියලු මිනිසුන් ප්‍රධාන කොටස් හතරකට බෙදන ලද බව දක්වෙන බ්‍රාහ්මණ ඉගැන්වීම වන්නේ,

(1) ස්වධර්මයයි (2) වර්ණධර්මයයි (3) ආශ්‍රමධර්මයයි
(4) ආපද්ධර්මයයි (5) නියාමධර්මයයි

02. බ්‍රාහ්මණයන් විසින් ඉගැන්වූ ''ආශ්‍රම ධර්ම'' යනුවෙන් අදහස් කෙරෙනුයේ,

(1) තාපස ජීවිතයේ දී අනුගමනය කළයුතු චාරිත්‍ර ධර්ම යන්නයි.
(2) ජීවිතයේ ඒ ඒ යුගවල ඉටු කළ යුතු වගකීම් සමුදායයි
(3) චතුර්වර්ණ කුල ක්‍රමයයි
(4) උත්පත්තියෙන් ඒ ඒ කුලවලට පැවරෙන රාජකාරි ක්‍රමයයි
(5) බ්‍රාහ්මණයන් විසින් ආපදා අවස්ථාවලදී ඉටු කළ යුතු යුතුකම් සමූහයයි

03. වෘක්ෂලතා, කෘමීන්. පක්ෂීන්, සිවුපාවුන් අතර ඒ ඒ ජාතිවලට අයත් ලක්ෂණ වෙන් වෙන්ව දක්නට ඇතත් මිනිසුන් අතර එවැනි විවිධත්වයක් දැකිය නොහැකි බව බුදුන්වහන්සේ මාසෙට්ඨ සූත්‍රයේ දී දේශනාකර ඇත. මෙම දේශනාව මගින් තහවුරු කිරීමට උත්සාහ ගෙන ඇත්තේ,

(1) සියලු ජාතීන්ට වඩා මිනිසා උසස් බවයි
(2) බ්‍රාහ්මණ චතුර්වර්ණය පදනම් විරහිත වූවත් බවයි
(3) මානව සාහිත්‍ය තුළ ද ස්වජාතිමය ලිංග විශේෂතා ඇති බවයි.
(4) උපතින්ම මිනිසුන් උස් පහත් ලෙස වර්ග කළ යුතු බවයි.
(5) පෙර කරන ලද කර්මවලට අනුව පමණක් මිනිසුන් එකිනෙකාගෙන් වෙනස්වන බවයි.

04. ආර්ථික අංශයේ නියමුවන් ලෙසින් ක්‍රියා කළ වෛශ්‍යයන් සතු කාර්යයන් මනුස්මෘතිය 191 ශ්ලෝකයෙන් විස්තර වෙයි. ඒ අනුව ඔවුන් සතු කාර්යයන් නොවූයේ,

(1) සත්වපාලනය (2) දන්දීම (3) මුදල් පොලී කිරීම
(4) යාග කිරීම (5) යාග කරවීම

05. වෛදික චින්තනයේ විකාශනය අනුව ඉන්දීය ඉතිහාසය ප්‍රාග් වෛදික යුගය හා පශ්චාත් වෛදික යුගය වශයෙන් ප්‍රධාන යුග දෙකකට බෙදා දැක්විය හැකිය. මේ අතරින් ප්‍රාග් වෛදික යුගය තුළ දක්නට ලැබුණු මූලික ආගමික පිළිවෙතක් වූයේ,

(1) ඊශ්වර නිර්මාණවාදයයි (2) සතිපූජාවයි (3) ජගත් මාතා වන්දනායි
(4) ඕම්කාරයෙන් යුතුව විසීමයි (5) යාගය ජනප්‍රිය වීමයි

06. බුද්ධකාලීන භාරතයේ විසූ ෂට් ශාස්තෘවරු සියලු දෙනා ජනතාවගේ ගරුබුහුමන් ලැබූ ආගමික නායකයෝ වූහ. ඔවුන් සියලු දෙනාම පිළිනොගත් ආගමික මතයක් වන්නේ,

(1) සියලු මිනිසුන් මරණයෙන් උච්ඡේදයට පත්වන බවයි.

(2) සියලු දෙනා නියතියකට අනුව සසර ගමන් කරන බවයි.

(3) සමාජයේ යහ පැවැත්මට කුලභේදය අත්‍යවශ්‍ය බවයි

(4) කිසිවකු කරන හොඳ හෝ නරක ක්‍රියාවකට විපාකයක් නැති බවයි.

(5) සියලු දෙනා සදාතනික පරමානු පදාර්ථවලින් නිර්මාණය වී ඇති බවයි.

07. භික්ෂුණී ශාසනය ආරම්භ කිරීමේ දී බුදු රදුන් උනන්දු කරවූයේ,

(1) සාරිපුත්ත හිමියන්ය. (2) මහාකාශ්‍යප හිමියන්ය. (3) නන්ද හිමියන්ය.

(4) ආනන්ද හිමියන්ය (5) රාහුල හිමියන්ය

08. බුදුන් වහන්සේ මහා ශ්‍රාවක ශ්‍රාවිකාවන්ට ඔවුනොවුන්ගේ සුවිශේෂතා පදනම් කරගෙන තනතුරු පිරිනැමූහ. විනයධර භික්ෂුණීන් අතර අග පදවිය ලැබුවේ,

(1) මහා ප්‍රජාපති ගෝතමී තෙරණියයි (2) උත්පලවන්නා තෙරණියයි

(3) ඛේමා තෙරණියයි (4) බුජ්ජුත්තරා තෙරණියයි

(5) පටාචාරා තෙරණියයි

09. සමාජ නිර්මාණය පිළිබඳ බ්‍රාහ්මණ මතය ප්‍රතික්ෂේප කරමින් බුදුරදුන් පලකල මතය විස්තර වන්නේ,

(1) සිඟාලෝවාද සූත්‍රයේය, (2) වාසෙට්ඨ සූත්‍රයේය (3) කූටදන්ත සූත්‍රයේය

(4) අග්ගඤ්ඤ සූත්‍රයේය (5) චක්කවත්ති සීහනාද සූත්‍රයේය

10. බ්‍රාහ්මණ සම්ප්‍රදාය තුළ කාන්තාවට සාමාජික, ආර්ථික, දේශපාලනික මෙන්ම ආගමික නිදහස ද අහිමි කොට තිබුනි. එහෙත් බුදු සමය පෙන්වා දෙන්නේ ආධ්‍යාත්මික විමුක්තිය සඳහා ස්ත්‍රීත්වය බාධාවක් නොවන බවයි. ඒ බව තහවුරු වන්නේ,

(1) ථේරී ගාථාවල දැක්වෙන භික්ෂුණීන්ගේ ප්‍රකාශ වලිනි.

(2) මවක් වශයෙන් වන්දනීය තත්වයක් කාන්තාවට හිමිකර දීමෙනි.

(3) බිරිඳක් වශයෙන් කාන්තාවගේ අයිතිවාසිකම් තහවුරු කර තිබීමෙනි.

(4) බිරිඳ ස්වාමිපුරුෂයාගේ හොඳම මිතුරිය ලෙස හඳුන්වා දීමෙනි.

(5) කාන්තාවන් ඒ ඒ තන්හි දී විචක්ෂණශීලීව ක්‍රියා කරන බව බුදුරදුන් දේශනා කිරීමෙනි.

11. මෙලොව යහපත උදෙසා දරු සම්පත්, දේපළ සම්පත්, නිරෝගී සම්පත්, මෙන්ම සතුරු උපද්‍රව මැඩලීම, සරුසාර අස්වැන්නක් ලැබීම වැනි විවිධ අවශ්‍යතා සඳහා ද, මහා බ්‍රහ්මයා හා එක්වීම (බ්‍රහ්ම සහව්‍යතාවය) සඳහා ද යාග කළ යුතු බව බමුණන්ගේ උපදේශයයි. යාගපැවැත්වීමේ දී දෙවියන් සතුටු වන ලෙස වේද පාඨ ගායනා කරන පූජකයා හඳුන්වන්නේ,

(1) හෝතෘ නමිනි (2) උද්සාතෘ නමිනි (3) අධ්මයර්‍යු නමිනි

(4) යඥා කාරක නමිනි (5) යාඥා දේශක නමිනි

12. බ්‍රාහ්මණ සම්ප්‍රදාය විසින් පුද්ගලයාගේ ජීවිතය අවධි හතරකට බෙදා දක්වනු ලබයි. එහිලා බ්‍රහ්මචාරී අවධියේ දී සපිරිය යුතු මූලික කාර්‍ය්‍ය ලෙස අවධාරණය කර ඇත්තේ,

(1) ගෘහජීවිතය අතහැර බ්‍රහ්මචාරීව විසීමයි

(2) බ්‍රහ්මචාරීව නිසි අධ්‍යාපනයක් ලබා ගැනීමයි.

(3) දිවි ඇතිතාක් බ්‍රහ්මචාරීව විසීමයි

(4) බ්‍රහ්මචාරී දිවියෙන් මිදී විවාහ ජීවිතයක් ගත කිරීමයි.

(5) සන්‍යාසියකු ලෙස බ්‍රහ්මචාරී දිවියක් ගත කිරීමයි

13. නිර්මාණ වාදය තදින් පිළිගෙන තිබූ භාරතීය සමාජයේ ඊට ප්‍රතිවිරුද්ධ තර්කානු කුල ඉගැන්වීමක් ඉදිරිපත් කරන ලද්දේ,

(1) පූරණකස්සප තුමන් විසිනි (2) නිගණ්ඨනාථ පුත්ත තුමන් විසිනි

(3) මක්ඛලි ගෝසාල තුමන් විසිනි. (4) ගෞතම බුදුරදුන් විසිනි

(5) සංජය බෙල්ලට්ඨි පුත්ත තුමන් විසිනි.

14. මානව සමාජය සංවර්ධනය වීමේ දී ක්‍රමයත්, සමාජ පරිපාලනයත් ඇති කිරීමට මුල් වූයේ,

(1) බ්‍රාහ්මණ මතයයි (2) මහජන මතයයි (3) අහේතුවාදයයි

(4) පරිණාම වාදයයි (5) භෞතික වාදයයි

15. වෛදික ඉගැන්වීම් වලට අනුව ස්වාමිපුරුෂයා මියගිය පසු බිරිඳ විසින් ඉටු කළ යුතු උසස්ම පරිත්‍යාගය ලෙස සලකන ලද්දේ,

(1) ස්වාමියා වෙනුවෙන් යාගහෝම පැවැත්වීමයි

(2) පුදපූජා පවත්වමින් දරුවන් රැක බලා ගැනීමයි

(3) ස්වාමියාගේ ඥාතිකුලවලට දාසියක් ලෙස සේවය කිරීමයි

(4) තම වැඩිමහල් පුතු යටතේ මෙහෙකාර සේවයේ යෙදීමයි

(5) ස්වාමියාගේ මළසිරුර දැවෙන සෑයට පැන ජීවිතය පූජා කිරීම

16. බ්‍රාහ්මණ සම්ප්‍රදාය හා ශ්‍රමණ සම්ප්‍රදාය භාරතීය ආගමික චින්තන තුළ ක්‍රමිකව විකාශනයට පත් වූ ප්‍රධාන ආගමික සම්ප්‍රදායන් දෙකයි. මෙයින් ශ්‍රමණ සම්ප්‍රදායේ අනන්‍යතා ලක්ෂණය වන්නේ,

(1) මිනිසුන් අතර කුලභේදය තිබිය යුතු යැයි පිළිගැනීම

(2) වේදය වැනි ශුද්ධ ග්‍රන්ථ පිළිගැනීම

(3) දෙවියන් හා මිනිසුන් අතර සම්බන්ධීකාරක පූජකයකු පිළිගැනීම

(4) ඥාණමාර්ගීය අනුගමනය කොට තමා විසින්ම විමුක්තිය ලබා ගත යුතුය

(5) බාහිර පුදපූජා මගින් විමුක්තිය ලද හැකියයි විශ්වාස කිරීම

The National e-learning Portal for The General Education

17. බුද්ධ කාලින භාරතීයයන් ධනෝපායනය පිණිස අනුගමනය කළ පිළිවෙත් අතර වාණිජ්‍ය හෙවත් වෙළඳාම දෙවැනි වූයේ කෘෂි කර්මාන්තයට පමණි. එහිදී ගැල් සියගණන් යොදවා වෙළඳාමෙහි යෙදීම, ද කොසඹෑ නුවර, පැළලුප් නුවර වැනි වෙළඳ නගර බිහිවීමද, නැව් මගින් භාණ්ඩ ආනයනය හා අපනයනය කිරීම ද දැකිය හැකි විය. මෙම සාධක මගින් ප්‍රකට කෙරෙන්නේ,

(1) බුද්ධකාලීන භාරතයේ දියුණු නගර පැවති බවයි

(2) භාණ්ඩ ප්‍රවාහණයට ගැල් බහුලව භාවිත කළ බවයි

(3) බුද්ධකාලීන භාරතය වාණිජකරණයට ලක්ව පැවති බවයි

(4) නැව් මගින් භාණ්ඩ ආනයනය  අපනයනය කළ බවයි

(5) බුද්ධකාලීන භාරතයේ විරැකියාව අවම වූ බවයි

18. සමාජ පරිණාමය පිළිබඳ බෞද්ධ විග්‍රහය ඉදිරිපත් කරන දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රය සමකාලීනව භාරතයේ පැවති සියලු ආගමික සම්ප්‍රදායික ඉගැන්වීම් වලට වෙනස් වූ ආකල්පයක් ගනී. එම විග්‍රහයට අනුව සමාජ පරිණාමය සිදු වී ඇත්තේ,

(1) කර්මානුරූපීවයි (2) හේතුප්‍රත්‍ය සහිතවයි (3) දේව නිර්මාණයක් ලෙසයි

(4) හේතුඵල වාදීවයි (5) නියති පරිණාමයක් ලෙසයි

19. පොළොවේ වසන සියලුම සතුන් ඝාතනය කොට එකම මස් ගොඩක් කළේ වී නමුත් ඉන් කිසිදු පාපයක් සිදු නොවන බව ප්‍රකාශ කළේ,

(1) නිගණ්ඨනාත පුත්තය (2) පූර්ණ කස්සපය (3) අජිත කේශකම්බිලිය

(4) මක්ඛලි ගෝසාලය (5) සංජය බෙල්ලට්ඨි පුත්තය

20. ''සත්වයන්ගේ කෙලෙසීම හෝ විසුද්ධිය පිණිස හේතු ඵල සම්බන්ධතාවක් නැත. තමන්ගේ හෝ අනුන්ගේ හෝ යහපත පිණිස කළයුතු දෙයක් නැත. සියලු සත්වයෝ වීර්‍ය්‍ය බලය, ආත්ම ශක්තිය රහිතයෝය.'' මෙයින් ඉගැන්වෙන ආගමික චින්තාව හඳුන්වන්නේ,

(1) පරම අවිහිංසාවාදය ලෙසයි (2) පුබ්බේ කත හේතුවාදය ලෙසයි

(3) අහේතු අප්‍රත්‍යවාදය ලෙසයි (4) උච්ඡේදවාදය ලෙසයි

(5) අමරා වික්ඛේප වාදය ලෙසයි

21. කෝසල, මගධ, මත්ස හා අවන්ති යන රාජාණ්ඩු බුද්ධ කාලීනව භාරතයේ පැවති ප්‍රමුඛ රාජ්‍යයන් ලෙස සැලකේ. මෙම රාජ්‍යවලට අයත් ප්‍රසිද්ධ නගර රාශියක් පැවැති බවද බෞද්ධ මූලාශ්‍රයන් හි දැක්වේ. පහත සඳහන් නගර අතුරෙන් කෝසල රාජ්‍යයට අයත් නගරයක් ඔස්සේ,

(1) රජගහ නුවරය (2) විශාලා මහනුවරය (3) සාකේත නුවරය

(4) පැළලුප් නුවරය (5) කුසිනාරා නුවරය

22. සුද්දෝධන රජතුමා සහභාගි වූ වප්මඟුල් උළෙලේදී සිදුහත් කුමරා ආනාපානා සති භාවනාව වැඩීම. භික්ෂූන්ගේ සිවුර මගධ කුඹුරු යායේ ආකෘතියට අනුව සකස් කර ගැනීමට බුදුරදුන් උපදෙස් දීමත්, කසීභාරද්වාජ සූත්‍රයේ දැක්වෙන ආකාරයට කසීභාරද්වාජ වැනි බ්‍රාහ්මණයන් පවා සී සෑමේ යෙදී සිටි බවත් ප්‍රකටය. මින් පැහැදිලි වන කරුණ වන්නේ,

(1) සුද්දෝධන රජතුමා සීසෑමේ නායකත්වය ගත් බවයි.

(2) වප්මඟුල් දා සිදුහත් බෝසතුන් ආනාපාන සති භාවනාවේ යෙදී සිටි බවයි.

(3) බමුණන් පවා කෘෂි කර්මාන්තයෙහි යෙදුන බවයි

(4) කුඹුරේ ආකෘතියට අනුව භික්ෂු චීවරය සකස් වූ බවයි.

(5) බුද්ධ කාලීන භාරතයේ දියුණු කෘෂි ආර්ථික රටාවක් පැවති බවයි.

23. ''සත්වයා සහ ලෝකය සර්ව බලධාරී දෙවියකු විසින් මවා පාලනය කරනු ලැබේ'' යන ප්‍රකාශයෙන් කියවෙන ආගමික ඉගැන්වීම හඳුන්වනු ලබන්නේ,

(1) ඊශ්වර නිර්මාණවාදය යනුවෙනි. (2) අහේතු අප්‍රත්‍යවාදය යනුවෙනි

(3) නියතිවාදය යනුවෙනි (4) පරිණාම වාදය යනුවෙනි

(5) ශාස්තෘ වාදය යනුවෙනි

24. ඵල අපේක්ෂාවෙන් තොරව තමන් වෙත පැවරෙන රාජකාරිය ඉටු කළ යුතු බව දැක්වෙන ඉගැන්වීම හඳුන්වන්නේ,

(1) වර්ණධර්ම නමිනි (2) ආශ්‍රමධර්ම නමිනි (3) සමධර්ම නමිනි

(4) ආපද්ධර්ම නමිනි (5) රාජ්‍යධර්ම නමිනි

25. බ්‍රාහ්මණ ගෘහපතියා හා බ්‍රාහ්මණ පූජකයා අතර අසමානතා දැක්වුනත් මේ දෙපිරිසටම පොදු වූත්, අනිවාර්ය වූත් කාර්යභාරයක් වූයේ,

(1) බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කිරීමයි (2) වේද අධ්‍යාපනයයි

(3) කාමයෙහි ආශක්ත නොවීමයි (4) වෙළඳාම් කිරීමයි

(5) කෘෂිකර්මාන්තයේ යෙදීමයි

26. වර්ණ ධර්ම පිළිබඳ ඉගැන්වීම් බ්‍රාහ්මණයන් විසින් විවිධ අභිප්‍රායයන් ඉෂ්ට කර ගැනීම සඳහා යොදාගත් බව පෙනේ. ඒ අනුව පහත දැක්වෙන කරුණු අතුරෙන් ඔවුන්ගේ ප්‍රධාන අභිමතාර්ථය වූයේ,

(1) ආර්ථික අයිතිය රැක ගැනීමයි (2) දේශපාලන අයිතිය රැකගැනීමයි

(3) ඉඩම් අයිතිය රැක ගැනීමයි (4) අධ්‍යාපන අයිතිය රැක ගැනීමයි

(5) පූජක අයිතිය රැක ගැනීමයි

27. බුද්ධකාලීන භාරතීය ආගමික නායකයින් අතර ෂට්ශාස්තෘවරු කැපීපෙනෙන පිරිසකි. ඔවුන් අතර උච්ඡේදවාදී භෞතික චින්තනයක් ඉගැන්වූ ශාස්තෘවරයා වූයේ,

(1) පූර්ණකස්සපය (2) අජිතකේශකම්බලය (3) පකුධ කච්චායනය

(4) සංජය බෙල්ලට්ඨි පුත්තය (5) මක්ඛලිගෝසාලය

28. භාරතයේ ව්‍යාප්තව තිබූ බ්‍රාහ්මණ සංස්කෘතියට ශ්‍රමණ සංස්කෘතිය එරෙහිව ගොඩ නැගුණු බලවේගයක් විය. එහිලා ෂට් ශාස්තෘවරු සුවිශේෂී වෙති. ඔවුන් ප්‍රතික්ෂේප කළ බ්‍රාහ්මණ සංස්කෘතියට අයත් ඉගැන්වීමක් වන්නේ,

(1) අකිරිය වාදයයි (2) නිර්මාණ වාදයයි (3) උච්ඡේද වාදයයි

(4) ශාස්වත වාදයයි (5) පුබ්බේකත හේතු වාදයයි

29. බුදු සමය කාන්තාවට සියලු සාමාජික අයිතිවාසිකම් ලබා දී කාන්තාව ද පුරුෂයා මෙන් ඥානවන්ත තැනැත්තියක් බව තහවුරු කළේය. මේ බව මනාව ප්‍රකට වන්නේ කාන්තාවට ද,

(1) පැවිදිවීමට අවසර ලබා දී මෙනි. (2) දහම් ඇසීමට අවසර ලබා දීමෙනි

(3) උපසපන් වීමට අවසර ලබා දීමෙනි. (4) ධර්මදේශනා කිරීමට අවසර ලබා දීමෙනි

(5) තනතුරු ප්‍රදානය කිරීමෙනි

30. විශ්වය හා සත්වයා ක්‍රමික පරිණාමයක ප්‍රතිඵලයක් ලෙස බුදුසමය උගන්වයි. බෞද්ධ පරිණාමවාදී චින්තනයේ ප්‍රධාන ලක්ෂණය ඔස්සේ පරිණාමය

(1) අහේතුකව සිදුවන බවයි (2) දේව කැමැත්ත අනුව සිදුවන බවයි

(3) භෞතික නියතිය මත සිදුවන බවයි (4) හේතුප්‍රත්‍ය නිසා සිදුවන බවයි

(5) කාලගුණ දේශගුණ විපර්යාසය නිසා සිදුවන බවයි

31. බෞද්ධ සැදැහැවතුන් විසින් දක වැඳ පුදා සංවේගය පහළ කර ගත යුතු බුද්ධ චරිතයේ අනුස්මරණීය සිදුවීම් හතරින් දෙකක් සිදුවී ඇති රාජ්‍ය වන්නේ,

(1) මගධ රාජ්‍යයයි (2) වජ්ජි රාජ්‍යයයි (3) වත්ස රාජ්‍යයයි

(4) මල්ල රාජ්‍යයයි (5) කෝසල රාජ්‍යයයි

32. ස්වධර්ම යන ප්‍රත්‍යයෙන් අදහස් කරනුයේ ස්වකීය කුලයට අයත් කාර්‍යයන්ය. හෙවත් වගකීම් ය. කුල අතර සංකල්පයක් ඇති නොවී අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස ස්වධර්ම අනුබලයක් කරගත්හ. ඇතැම් ස්වධර්ම බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය යන වර්ණත්‍රයටම සමානවන නමුදු සමහර සමධර්ම අසමාන වේ. ඒ අනුව ඉහත වර්ණ තුනටම පොදු සමධර්මයක් ලෙස සලකා ඇත්තේ,

(1) කෘෂිකර්මාන්තයයි (2) යාගකරවීමයි (3) වෙළඳාමයි

(4) යාග කිරීමයි (5) කාමයෙහි නොඇලීමයි

33. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය යන වර්ණ තුනටම ආපදා අවස්ථාවන් හිදී සිදු කළ හැකි කටයුත්තක් ලෙස හඳුනාගෙන ඇත්තේ,

(1) යාගකරවීමයි (2) කෘෂිකර්මාන්තයයි (3) කාමයෙහි නොඇලීමයි

(4) ප්‍රජාපාලනයයි (5) ඉගැන්වීමයි

34. මානව සංහතියේ ඇත්තේ නානත්වයක් නොව ඒකත්වයක් බව පෙන්වා දෙන බුදු දහම මානව වර්ගයාගේ යම් විවිධත්වයක් දැකීමට හැකි යයි ද අවධාරණය කෙරේ. එකී විවිධත්වයට හේතු වන්නේ,

(1) ජීව විද්‍යාත්මක පදනමයි (2) ඓතිහාසික පදනමයි

(3) සමාජ විද්‍යාත්මක පදනමයි (4) ආචාර විද්‍යාත්මක පදනමයි

(5) ආර්ථික විද්‍යාත්මක පදනමයි

35. භික්ෂූන් අතර විවිධ අංශයන්ගෙන් විශේෂ කුසලතා දක්වන ලද භික්ෂුණීන්ට උසස් සම්මාන තනතුරු පිරිනමන ලද ආකාරය දැකිය හැකිය. ඔවුන් අතරින් ධ්‍යානලාභී භික්ෂුනීන් අතර අග්‍ර වූයේ,

(1) ප්‍රජාපති ගෝතමියයි (2) ඛේමා තෙරණියයි (3) උත්පලවණ්ණා තෙරණියයි

(4) පටාචාර තෙරණියයි (5) නන්දා තෙරණියයි

36. සප්ත භරියා සූත්‍රයෙන් භාර්‍යාවන්ගේ ලක්ෂණ අනුව, කොටස් හතකට වර්ගකර ඇත. එහිදී මිතුරියක් බඳු බිරිඳ හඳුන්වා ඇත්තේ,

(1) මාතු භරියා නමිනි (2) භගිනි භරියා නමිනි (3) දාසි භරියා නමිනි

(4) සඛී භරියා නමිනි (5) චෝරභරියා නමිනි

37. පශ්චාත් වෛදික යුගයේ දී කාන්තාව පිළිබඳව ආකරුණිකව කටයුතු කළ ආකාරය ප්‍රකට කෙරෙන සාධකයක් වන්නේ,

(1) මාතෘ දෙවඟන පිදීමයි (2) පාර්වතී දෙවඟන පිදීමයි

(3) සති පූජාවයි (4) ජගන්මාතා වන්දනාවයි (5) ශක්ති පූජාවයි

38. ගංගාවක තබන ලද කෙමනක් මත්ස්‍යයන්ට යම් පමණ විපත්ති දායක වෙයි ද මෙම දර්ශනය ද සමාජයට එතරම්ම විපත්ති ගෙන දෙන්නකි. එබඳු දර්ශනයක් හඳුන්වා දී ඇති නිසාම ''මෝඝ පුරිස'' (හිස් මිනිසා) යන අවඥා සහගත නාමයකින් මොහු හැඳින්වීමට බුදුරදුන් පෙළඹී ඇත. ෂට් ශාස්තෘන් අතුරින් ඔහු,

(1) නිගණ්ඨනාත පුත්තයි (2) මක්ඛලිගෝසාලයි (3) පූරණ කස්සපයි

(4) අජිත කේශකම්බලයි (5) පකුධ කච්චායනයි

39. බුදු සමය තුළ කාන්තාව පූර්ණ නිදහසක් භුක්ති වින්දාය. භික්ෂුනියක, උපාසිකාවක, මවක හා බිරිඳක ලෙස ඇය ලද නිදහස පෙළදහමින් තහවුරු වේ. උපාසිකාවක ලෙස බුද්ධකාලීනව ප්‍රකට එවැනි පරමාදර්ශී කාන්තාවක් වූයේ,

(1) උප්පලවණ්ණාය (2) ධම්මදින්නාය (3) ඛේමාය

(4) ඛුජ්ජුත්තරාය (5) පටාචාරාය

40. ''සත්වයාගේ කෙලෙසීමට හෝ පිරිසිදු වීමට හේතුවක් හෝ ප්‍රත්‍යයක් නොමැත. සියලු සත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ තමන්ගේ ශක්තියක්, බලයක් නොමැතිව ලෝක ස්වභාවයට අනුගතව මුහුකුරා යාමෙන් අභිජාති සයකම සැප දුක් විඳිති.'' මෙම මත වාදයෙන් ප්‍රකාශ වන්නේ,

(1) නියති වාදයයි (2) සංශය වාදයයි (3) පුබ්බේකත හේතුවාදයයි

(4) පසාද් වාදයයි (5) අමරා වික්ෂේප වාදයයි

41. ෂට්ශාස්තෘවරු අතරින් සමහරු අකිරියවාදී අදහස් පළකළහ. බුදු රදුන් මෙකී දෘෂ්ටිවාදය දැඩිව විවේචනයට ලක් කළ අයුරු බෞද්ධ සාහිත්‍යයෙන් හඳුනා ගත හැකිය. ඊට එක් හේතුවක් වී ඇත්තේ,

(1) සමාජය තුළ කිරියවාදීන් බහුල නොවන නිසාය

(2) සාමජයතුළ අන්තවාදී ක්‍රියා සිදු නොවන නිසාය

(3) සමාජය තුළ සදාචාරය අර්ථවත් කළ නොහැකි නිසාය

(4) සමාජය තුළ ආත්මවාදීන් බහුලවන නිසාය

(5) සමාජය තුළ ශාස්තෘවාදීන් බහුලවන නිසාය

42. බුද්ධ කාලීන භාරතයේ ශ්‍රමණ සම්ප්‍රදායට අයත් ඇතැම් ශ්‍රමණයන්ගේ දුෂ්කර ව්‍රත සමාදානය බුදුන්වහන්සේ විවේචනයට ලක් කළහ. මේ නිසා උන්වහන්සේට ''සියලු තපස්කම් ගරහන්නේය, සියලු තවුසන්ට දොස් නගන්නේය. අපහාස කරන්නේ යැ'' යි ඇතැම් පිරිස් චෝදනා නැගුහ. බුදුරදුන් එම චෝදනා ප්‍රතික්ෂේප කරමින් පවසා ඇත්තේ,

(1) තමා තවන අනුන් නොතවන ව්‍රත සමාදානයයි

(2) තමා නොතවන අනුන් තවන ව්‍රත සමාදානයයි

(3) තමා තවන අනුන්ද තවන ව්‍රත සමාදානයයි

(4) තමන් නොතවා අනුන් නොතවන ව්‍රත සමාදානයයි

43. බුද්ධ කාලයේ පැවති ගණ රනේන්ද්‍ර රාජ්‍ය අතුරෙන් ප්‍රබල රාජ්‍යයක්ව පැවතියේ,

(1) මල්ල රාජ්‍යයයි (2) කෝසල රාජ්‍යයයි (3) වජ්ජි රාජ්‍යයයි

(4) කාසි රාජ්‍යයයි (5) අවන්ති රාජ්‍යයයි

44. ප්‍රාථමික සමාජ ඒකකයක් වූ ගෘහස්ථ ජීවිතයේ ප්‍රභවය දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ දී දක්වා ඇත්තේ,

(1) මෛථුන්දම් සෙවීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

(2) සමාජය තුළ සොරකම බහුලවීමේ ප්‍රතිඵලයක් වශයෙනි

(3) එක් රැස්කොට අනුභව කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

(4) දෘෂ්ටානු ගතියට පැමිණීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

(5) පෞද්ගලික දේපළ පරිහරණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

45. බුද්ධකාලීන ආගමික ඉගැන්වීම් තුළ සත්වයා හා ලෝකය මවා පාලනය කරනු ලබන බලවේගයන් ඇතැයි යනුවෙන් පිළිගෙන කටයුතු කිරීම.

(1) හේතුඵලවාදය පිළිගැනීමකි
(2) අධිච්ච සමුප්පන්නවාදය පිළිගැනීමකි
(3) පුබ්බේකත හේතුවාදය පිළිගැනීමකි
(4) නියතිවාදය පිළිගැනීමකි
(5) ඊශ්වර නිර්මාණවාදය පිළිගැනීමකි.

46. වෛදික ඉගැන්වීම් අනුව විශ්වය හා සත්වයා මවන ලද්දේ සර්වබලධාරී මහා බ්‍රහ්මයා විසිනි. එනිසා හා මහා බ්‍රහ්මයා අතර සම්බන්ධය තහවුරු කිරීමෙහිලා ඔවුන් උපයෝගී කර ගත් සංකල්පයක් ලෙස හඳුනාගත හැක්කේ,

(1) භූතබලය පිළිබඳ ඉගැන්වීමයි.
(2) විශ්වබලය පිළිබඳ ඉගැන්වීමයි
(3) කායබලය පිළිබඳ ඉගැන්වීමයි
(4) ආත්මබලය පිළිබඳ ඉගැන්වීමයි
(5) ධර්මබලය පිළිබඳ ඉගැන්වීමයි

47. වර්ණභේද සංකල්පය ඉදිරිපත් කිරීමෙන් බමුණන්ගේ ප්‍රධාන අභිමතාර්ථය වූයේ,

(1) ආර්ථික අයිතිය රැකගැනීමයි
(2) දේශපාලන අයිතිය රැකගැනීමයි
(3) ඉඩම් අයිතිය රැකගැනීමයි
(4) අධ්‍යාපන අයිතිය රැකගැනීමයි
(5) පූජක අයිතිය රැකගැනීමයි

48. සමාජ ප්‍රභවය පිළිබඳව හේතුඵලවාදී, යථාර්ථවාදී ඉගැන්වීම් ක්‍රමයක් දක්වා ඇත. එය මැනවින් තහවුරු වන්නේ,

(1) දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේය
(2) මජ්ඣිම නිකායේ අස්සලායන සූත්‍රයේය
(3) දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේය
(4) මජ්ඣිම නිකායේ මාසෙට්ඨී සූත්‍රයේය
(5) මජ්ඣිම නිකායේ මධුර සූත්‍රයේය

49. උච්ඡේදවාදී භෞතික චින්තනයක් ඉගැන් වූ ශාස්තෘවරයා වූයේ,

(1) පූර්ණ කස්සපය
(2) අජිත කේසකම්බලය
(3) පකුධ කච්චායනය
(4) සංජය බෙල්ලට්ඨි පුත්තය
(5) මක්ඛලී ගෝසාලය

50. නිගණ්ඨනාථ පුත්ත ශාස්තෘවරයා කලුරිය කරන ලද්දේ පාවා නුවර දීය. බුදුන් වහන්සේ වස් වසා සිටි චුන්දකර්මාර පුත්‍රයාගේ අඹවනය පිහිටා තිබුණේ ද මෙහිය. මෙම අගනුවරයත් රාජ්‍ය වන්නේ,

(1) මගධ රාජ්‍යයයි
(2) කෝසල රාජ්‍යයයි
(3) වජ්ජි රාජ්‍යයයි
(4) මල්ල රාජ්‍යයයි
(5) අවන්ති රාජ්‍යයයි

(ල. 2 x 50 = 100)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# බෞද්ධ ශිෂ්ටාචාරය - II

12 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

- I කොටසින් ප්‍රශ්න දෙකක්ද, II කොටසින් ප්‍රශ්න තුනක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

01. (i) බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව ශුද්‍ර වර්ණයට නියමිත ''සමධර්ම'' නම් කරන්න.

(ii) වෛදික සාහිත්‍යයේ දක්වෙන ''ආශ්‍රව ධර්ම'' අතරින් සත්‍ය අවධිය හඳුන්වා දෙන්න.

(iii) චතුර්වර්ණයේ ඓතිහාසික ප්‍රභවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ගෙන හැර දක්වන්න.

(iv) වෛදික සාහිත්‍යයට අයත් ග්‍රන්ථ පහක් නම් කරන්න.

(v) බුදු සමයෙන් කාන්තාවට හිමිකරදුන් ආගමික ස්වාධීනත්වය උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න.

02. (i) අජිත කේසකම්බලී ශාස්තෘවරයාගේ ඉගැන්වීම් කෙටියෙන් දක්වන්න.

(ii) සසුනේ ඉගැන්වීම් පිළිබඳ බෞද්ධ ආකල්පය ගෙන හැර දක්වන්න

(iii) බ්‍රාහ්මණ සම්ප්‍රදායෙන් ශ්‍රමණ සම්ප්‍රදාය වෙන්කොට හඳුනාගත හැකි අනන්‍යතා ලක්ෂණ පහක් නම් කරන්න.

(iv) ක්‍රි. පූ. හයවැනි සියවස වන විට භාරතීය සමාජය නාගරීකරණයට ලක්වෙමින් පැවති බවට සාධක පහක් පෙන්වා දෙන්න.

(v) බුද්ධ කාලීන භාරතයේ පැවති මහා රාජ්‍යයන් අතර වූ කෝසල රාජ්‍යය හඳුන්වා දෙන්න.

03. (i) වානප්‍රස්ත ආශ්‍රමයේදී සම්පූර්ණ කළයුතු කාර්යයන් පැහැදිලි කරන්න.

(ii) බ්‍රාහ්මණ ඉගැන්වීම් වලින් කාන්තාව පහත් තත්වයෙහි ලා සලකා ඇති ආකාරය පෙන්වා දෙන්න.

(iii) බ්‍රාහ්මණ සංස්කෘතියෙහි කුමන අංගයක් බුදුරදුන්ගේ විචාරයට ලක්වී දැයි නම් කරන්න.

(iv) කර්මය පිළිබඳ ෂට් ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් ගෙන හැර දක්වන්න.

(v) රාජ්‍යත්වයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ විවරණය ගෙනහැර දක්වන්න.

## II කොටස

04. (i) වෛදික චින්තනය තුළ මිනිසා මැවුම් කරුවකුගේ තත්වයට පත්කර තිබූ ආකාරය විස්තර කරන්න.

(ii) ෂට් ශාස්තෘවරුන් විසින් ඊශ්වර නිර්මාණ වාදය ප්‍රතික්ෂේප කිරීමට යොදාගත් සාධක ගෙනහැර දක්වන්න.

(iii) නියති පරිණාම වාදය බුදු රදුන් ගේ දැඩි විවේචනයට ලක් වූයේ ඇයිදැයි විමසීමට ලක්කරන්න.

(iv) සමාජය තුළ වර්ණ හතරක් ප්‍රභවය වූයේ කෙසේ දැයි යන්න බුදු දහමේ දක්වෙන විවරණය මගින් පැහැදිලි කරන්න.

05. (i) බුද්ධකාලීන භරතීය දේශපාලන ව්‍යුහය සකස් වී තිබූ ආකාරය ඓතිහාසික නයින් විමර්ශනය කරන්න.

(ii) මානව ක්‍රියාකාරකම් විෂයෙහි කාන්තාව පුරුෂයා හා සමාන වන බවට පිළිගෙන ඇති සාධක දක්වන්න.

(iii) බ්‍රාහ්මණ ඒකාධිකාරයට එරෙහිව ශ්‍රමණ සම්ප්‍රදාය ඉදිරි පත්කළ ප්‍රධාන මතවාද ගෙනහැර දක්වන්න.

(iv) ෂට් ශාස්තෘන් අතුරෙන් ඉදිරිපත් වූ භෞතිකවාදී ඉගැන්වීම් මොනවාදැයි පරීක්ෂා කරන්න.

06. (i) සමාජ ප්‍රභවය හා පරිණාමය පිළිබඳ බෞද්ධ මතය පැහැදිලි කරන්න.

(ii) බුද්ධ කාලය වන විට භාරතීය සමාජය වාණිජ කරණයට ලක් වෙමින් පැවතියේ කෙසේදැයි බෞද්ධ මූලාශ්‍ර ඇසුරෙන් විමසන්න.

(iii) බුදු දහමින් කාන්තා අභිමානය සුරැකී ඇති අයුරු පැහැදිලි කරන්න.

(iv) බුද්ධ කාලීන භාරතයේ විසූ විවිධ ශ්‍රමණ කණ්ඩායම් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

07. (i) බ්‍රාහ්මණයන් විසින් තම සමාජමය හා දේශපාලනික ආධිපත්‍යය තහවුරු කර ගැනීම සඳහා යොදන ලද උපක්‍රම පැහැදිලි කරන්න.

(ii) බෞද්ධ ඉගැන්වීම් මගින් වනිතාවට සිදු වූ යහපත ඇගයීමට ලක් කරන්න.

(iii) වෛදික යුගයේ දී බ්‍රාහ්මණයන් සතුව තිබූ ආධිපත්‍යය බුද්ධ කාලය වන විට පිරිහෙමින් පැවැතිනි. මෙයට හේතු පරීක්ෂා කරන්න.

(iv) බුද්ධ කාලීන භාරතයේ වෙළඳ කටයුතු පිළිබඳ වාර්තාවක් සපයන්න.

08. (i) පකුධ කච්චායනගේ දර්ශනය කෙටියෙන් පහදන්න.

(ii) සංජය බෙල්ලට්ඨි පුත්ත අමරා වික්ඛේපවාදයෙන් අදහස් කළේ කුමක් දැයි පැහැදිලි කරන්න.

(iii) බ්‍රාහ්මණ ආධි පත්‍ය යටතේ භාරතීය කාන්තාවන්ට නියමකර තිබූ කාර්යභාරය පෙන්වා දෙන්න.

(iv) බුද්ධ කාලීන භාරතයේ දියුණු කෘෂි ආර්ථික ජීවන රටාවක් පැවතුන බව සනාථ කරන්න.

(ල. 5 x 20 = 100)